මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

කොළඹ වරාය නගරය සංවර්ධන ව්‍යාපෘතිය

ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU)

පුරප්පාඩු

01. ව්‍යාපෘති විස්තරය :

කොළඹ වරාය නගරය යනු ශ්‍රී ලංකාවේ සජීවී වාණිජ අගනගරය වන කොළඹ කේන්ද්‍රීය ව්‍යාපාරික දිස්ත්‍රික්කයේ දිගුවක් ලෙස ඉදිකෙරෙන නවතම නගර සංවර්ධන ව්‍යාපෘතියකි. මුහුදු ගොඩකර ඉදි කරන ලද හෙක්ටයාර 269ක භූමි ප්‍රමාණයක පැතිරී ඇති කොළඹ වරාය නගරය, ඉන්දියන් සාගරයේ උණුසුම් ජල තීරය අද්දර අසමසම සැලසුම්ගත නාගරික ජීවන රටාවක් පිරිතමමින් දකුණු ආසියාවේ ප්‍රමුඛතම නේවාසික, සිල්ලර වෙළඳ සහ ව්‍යාපාරික ගමනාන්තය බවට පත්වනු ඇත. **ශ්‍රී ලංකා රජයට පැවරී ඇති වගකීම් සම්බන්ධීකරණය, කළමනාකරණය, නිරීක්ෂණය සහ අධීක්ෂණය සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකයක් (PMU)** ස්ථාපිත කර ඇත.

02. පිරවීමට නියමිත පුරප්පාඩු තනතුර :

අනු අං.	තනතුර	02/2026 චක්‍රලේඛයට අනුව වැටුප් කාණ්ඩය	පුරප්පාඩු සංඛ්‍යාව
01	ව්‍යාපෘති අධ්‍යක්ෂ	කාණ්ඩය - A	01

03. අවශ්‍ය සුදුසුකම් :

28.03.2026 දිනැති අංක 02/2026 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව, ඉහත තනතුර සඳහා අයදුම් කිරීමට අයදුම්කරු පහත සඳහන් සුදුසුකම් වලින් අවම වශයෙන් එක් සුදුසුකමක් හෝ සම්පූර්ණ කර තිබිය යුතුය.

අංකය	තනතුර / තනතුරු	වැටුප් කාණ්ඩය	සුදුසුකම්
01	ව්‍යාපෘති අධ්‍යක්ෂ	කාණ්ඩය - A	(පහත 1 හෝ 2) (1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් ඉංජිනේරු විද්‍යාව, ප්‍රමාණ සමීක්ෂණය, වාස්තු විද්‍යාව, නාගරික සැලසුම්කරණය හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයක ප්‍රථම උපාධියක් **සහ** අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (Masters) / අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වයක් (Associate Membership) / ඊට සමාන වෘත්තීය සුදුසුකමක් **සමග** අදාළ ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 12ක පළපුරුද්දක් තිබිය යුතු අතර, ඉන් වසර 06ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පළපුරුද්දක් විය යුතුය. (2) අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආයතනික / අධිසාමාජිකත්වයක් (Corporate / Fellow Membership) **සමග** අදාළ ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 10ක පළපුරුද්දක් තිබිය යුතු අතර, ඉන් වසර 05ක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ පළපුරුද්දක් විය යුතුය.

04. පොදු කොන්දේසි:

අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

අයදුම්කරුට කිසිදු අපරාධ චාර්තාවක් නොතිබිය යුතු අතර, අධිකරණයක් මගින් කිසිදු අපරාධ වරදකට වරදකරු වී නොතිබිය යුතුය.

වයස අවුරුදු 64 ට වැඩි කිසිදු පුද්ගලයෙකු මෙම ව්‍යාපෘතියට බඳවා ගැනීම සඳහා සලකා බලනු නොලැබේ.

05. වැටුප -

2026.03.28 දිනැති අංක 02/2026 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ සහ අදාළ අනෙකුත් කළමනාකරණ සේවා චක්‍රලේඛවල සඳහන් පරිදි වැටුප් ගෙවනු ලබන අතර, අදාළ චක්‍රලේඛවලට අනුව දීමනා සහ ප්‍රතිලාභ ලබා ගැනීමට හිමිකම් ඇත.

06. අයදුම්පත් ඉදිරිපත් කිරීමේ කොන්දේසි :-

රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන්ට අංක 02/2026 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 2:3:3 ඡේදයේ (ආ) කොටසට අනුව අයදුම් කළ හැකි අතර, රජයේ සේවයේ නොමැති අයදුම්කරුවන් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලැබේ. රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් යොමු කළ යුතුය.

07. අයදුම්පත්- :

රාජ්‍ය / රාජ්‍ය නොවන ආයතනවල සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මගින් යොමු කළ යුතු අතර, සෘජුව ඉදිරිපත් කරන අයදුම්පත් සුදුසුකම්, පළපුරුද්ද සහ අනෙකුත් අදාළ තොරතුරු සමග පහත සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනයට 2026 දෙසැම්බර් 08 දින හෝ ඊට පෙර යොමු කළ යුතුය.

විද්‍යුත් තැපැල් ලිපිනය : psportcity@gmail.com